දුරකථන ) 0112669192 , 0112675011
தொலைபேசி ) 0112698507 , 0112694033
Telephone ) 0112675449 , 0112675280

ෆැක්ස් ) 0112693866
பெக்ஸ் ) 0112693869
Fax )0112692913

විද්‍යුත් තැපෑල )postmaster@health.gov.lk
மின்னஞ்சல் முகவரி )
e-mail )

වෙබ්අඩවිය ) www.health.gov.lk
இணையத்தளம் )
website )

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

මගේඅංකය )DDG/(PHS-1)/NSACP/2011
எனது இல )
My No. )

ඔබේඅංකය )
உமது இல )
Your No. : )

දිනය )2016.10. 27
திகதி )
Date )

# සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
# சுகாதார,போசணைமற்றும் சுதேசவைத்தியஅமைச்சு
# Ministry of Health, Nutrition& Indigenous Medicine

පොදු චක්‍රලේඛ අංක: 01 - 59 /2016

සියලුම පළාත්/ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකවරුන්,
සියලුම ශික්ෂණ රෝහල් අධ්‍යක්ෂකවරුන්,
සියලුම විශේෂිත ව්‍යාපාර ප්‍රධානීන්,
සියලුම සෞඛ්‍ය ආයතන ප්‍රධානීන්,
සියලුම විශේෂඥ ප්‍රසව හා නාරිවේද වෛද්‍යවරුන්,

**ශ්‍රී ලංකාවෙන් සංජානනීය උපදංශය සහ මවගෙන් දරුවාට HIV වැළදීම තුරන් කිරීමේ වැඩසටහන (EMTCT of HIV and Syphilis)**

ශ්‍රී ලංකාව වසර 2017 වසරෙහි අවසානය වනවිට සංජානනීය උපදංශය සහ මවගෙන් දරුවාට HIV වැළදීම තුරන් කිරීමට හැකි රටක් ලෙස හඳුනාගෙන ඇත.

02. මෙම රෝග තුරන් කිරීම සඳහා ශ්‍රී ලංකාව, ගර්භනී මව්වරුන්ගේ HIV සහ උපදංශය රෝග හඳුනා ගැනීමේ මූලික පරීක්ෂණ පහසුකම් දීපව්‍යාප්තව ආවරණය වන පරිදි කල යුතුය. වසර 2015 අග වනවිට ශ්‍රී ලංකාවේ සියලුම ගර්භනී මව්වරුන්ම පාහේ (98%) උපදංශය සඳහා පරීක්ෂා කර ඇත.

03. සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් සාකච්ඡා වට කිහිපයකින් පසුව සියලුම ගර්භනී මව්වරුන්ගේ HIV සඳහා වන මූලික පරීක්ෂණය කිරීමට ප්‍රතිපත්තිමය තීරණයක් ගත් අතර එය දැනට පවතින උපදංශය සඳහා වන රුධිර පරීක්ෂණය සිදුකරන අවස්ථාවේම කිරීමට තීරණය විය. ගර්භනී මව්වරුන් HIV සඳහා පරීක්ෂා කිරීම 2013 වර්ෂයේ සිට පුළුල් කල අතර 2012 දී 5.6% ක් වූ එය 2015 අග වන විට 71.2%ක් දක්වා වැඩි කිරීමට සමත් විය. මවගෙන් දරුවාට HIV ආසාදනයවීම තුරන් කිරීමේ තත්ත්වයට ළඟාවීමට 2016 අග වනවිට එම අගය 95% ක් දක්වා වැඩි කිරීම අවශ්‍ය වේ.

04. ශ්‍රී ලංකාවෙන් සංජානනීය උපදංශය සහ මවගෙන් දරුවාට HIV ආසාදනය තුරන් කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා සෞඛ්‍යය අමාත්‍යාංශය, සියලුම රජයේ සහ පෞද්ගලික අංශයේ සේවයේ නියුතු විශේෂඥ ප්‍රසව හා නාරිවේද වෛද්‍යවරුන්ගේ කැපවීම සහ සහයෝගය බලාපොරොත්තු වේ. පහත දැක්වෙන උපදෙස් අනුව ඔබගේ ආයතනය තුල උපදංශය සහ HIV හඳුනා ගැනීමේ පූර්ව ප්‍රසව පරීක්ෂණ සිදු කිරීම සඳහා සේවාවන් වැඩිදියුණු කිරීමට පියවර ගැනීම අත්‍යාවශ්‍ය වේ.

(අ) රාජ්‍ය අංශය

i. සියලුම ගර්භනී මව්වරුන් සති 12 ට පෙර උපදංශය සහ HIV සඳහා පරීක්ෂා කල යුතුය. (එය මුලින්ම සායනයට පැමිණි දින කිරීමට හැකි නම් වඩා යෝග්‍ය වේ).

ii. පූර්ව ප්‍රසව සායන ( MOH සහ රෝහල් ANC සායන ) මගින් වැකුයුටේනර් නලයකට රුධිරය 5 cc ගෙන "උපදංශය සහ HIV" සඳහා ලෙස සඳහන් කර ළගම ඇති ලිංගාශ්‍රිත රෝග සායනයට ලැබෙන්නට සැලැස්විය යුතුය. ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ (RDHS), වෛද්‍ය නිලධාරී/ගර්භනී සහ ළමාසෞඛ්‍යය (MOMCH), වෛද්‍ය නිලධාරී/ලිංගාශ්‍රිත රෝග (MO/STD) සහ සෞඛ්‍යය වෛද්‍ය නිලධාරීන් (MOHS) හා සාකච්ඡා කිරීමෙන් පසුව රුධිර සාම්පල ප්‍රවාහනය සඳහා තමන්ට ගැලපෙන ක්‍රමයක් සකසා ගත යුතුය.

iii. මව්වරුන් නැවත සායනයට පැමිණෙන දින, උපදංශය සහ HIV පරීක්ෂණ වාර්තා තිබේදැයි පරීක්ෂාකොට ඒවා නියමිත පරිදි ගර්භනී සටහන් පත්‍රයේ සටහන්කළ යුතුය.

iv. ලිංගාශ්‍රිත රෝග සායන මගින් පූර්ව ප්‍රසව සායන වලින් එවනු ලබන රුධිර සාම්පල් උපදංශය සහ HIV සඳහා වන මූලිකපරීක්ෂණ සිදු කර එම වාර්තා නැවත අදාළ නිලධාරීන් වෙත ලබා දිය යුතුය.

v. උපදංශය හෝ HIV ආසාදිත ලෙස තහවුරුවන රුධිර සාම්පල පිළිබඳ තොරතුරු අදාළ වෛද්‍ය නිලධාරීන් (MO), සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් (MOH) හෝ විශේෂඥ ප්‍රසව හා නාරිවේද වෛද්‍යවරුන් (VOG) වෙත රහස්‍යභාවය රැකෙන පරිදි දැන්විය යුතුය.

vi. වැඩිදුර පරීක්ෂණ සහ ප්‍රතිකාර සඳහා, උපදංශය හෝ HIV මූලික පරීක්ෂණයෙන් සොයාගන්නා රෝගය සහිත ගර්භනී මව්වරුන් ලිංගාශ්‍රිත රෝග සායනයකට යොමුකළ යුතුය.

vii. ගර්භනී සමය තුල උපදංශය සහ HIV මූලික පරීක්ෂණ සිදු නොකළ මව්වරුන්ගේ දරු ප්‍රසූතියෙන් පසුව, රෝහලෙන් පිටවීමට පෙර එම පරීක්ෂණ කල යුතුය.

viii. උපදංශය හෝ HIV සහිත ගර්භනී මව්වරුන්ට රෝහල්ගත වීම ඇතුළු අදාළ සියලුම සේවාවන් කොන්කිරීමකින් හෝ පහත්කොට සැලකීමකින් තොරව ලබාදිය යුතුය.

ix. දිස්ත්‍රික්ක මට්ටමෙන්, සංජානනීය උපදංශය සහ මවගෙන් දරුවාට HIV වැළදීම තුරන් කිරීමේ වැඩසටහන පිළිබඳව සෑම මාස හයකටම වරක් ප්‍රාදේශීය සෞඛ්‍යය සේවා අධ්‍යක්ෂ (RDHS), විශේෂඥ ප්‍රසව හා නාරිවේද වෛද්‍යවරුන් (VOG), වෛද්‍ය නිලධාරී/ ගර්භනී සහ ළමාසෞඛ්‍යය (MOMCH ), සෞඛ්‍යය වෛද්‍ය නිලධාරීන් (MOH) හා ලිංගාශ්‍රිත රෝග සායන නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් සාකච්ඡා විය යුතුය.

x. ගබ්සාවීම්, මළදරු උපත් ඇතුළුව සියලුම ගර්භනී සංකූලතා වාර්තා වූ මව්වරුන් උපදංශය සහ HIV සඳහා මුල් ගර්භනී අවධියේ පරීක්ෂාකර නොමැතිනම් පරීක්ෂා කිරීම අවශ්‍ය වේ.

(ආ) පුද්ගලික අංශය

i. සියලුම ගර්භනී මව්වරුන් සති 12 ට පෙර උපදංශය සහ HIV සඳහා පරීක්ෂා කල යුතුය. (එය මුලින්ම සායනයට පැමිණි දින කිරීමට හැකි නම් වඩා යෝග්‍ය වේ).

ii. ගුණාත්මක තත්ත්වයෙන් යුතු පිළිගත් පරීක්ෂනාගාරයකින් උපදංශය සහ HIV සඳහා වන මූලික පරීක්ෂණ සිදු කල යුතුය.

iii. උපදංශය සහ HIV පරීක්ෂණ සහ එහි ප්‍රතිඵල වාර්තා නියමිත පරිදි ගර්භනී සටහන් පත්‍රයේ සටහන් කළ යුතුය.

iv. උපදංශය හෝ HIV ආසාදිත බවට තහවුරුවන ගර්භනී මව්වරුන්, ජාතික ප්‍රතිපත්තියට අනුකූලව ලිංගාශ්‍රිත රෝග පිළිබඳ විශේෂඥ වෛද්‍යවරයෙකුට හෝ එම සායනයකට යොමුකළ යුතුය.

v. උපදංශය හෝ HIV සහිත ගර්භනී මව්වරුන්ට රෝහල්ගත වීම ඇතුළු අදාළ සියලුම සේවාවන් කොන්කිරීමකින් හෝ පහත්කොට සැලකීමකින් තොරව ලබාදිය යුතුය.

vi. උපදංශය හෝ HIV සහිත ගර්භනී මව්වරුන් පිළිබඳ විස්තර නියමිත පරිදි අදාළ ආකෘතිපත්‍රය පුරවා ජාතික ලිංගාශ්‍රිත රෝග සහ ඒඩ්ස් මර්ධන වැඩසටහන (NSACP) වෙත ලැබීමට සැලැස්විය යුතුය.

05. ශ්‍රී ලංකාවේ HIV ජාතික ප්‍රතිපත්තියට අනුව "HIV ආසාදිත පුද්ගලයන්ට කොන්කිරීමකින් තොරව ප්‍රතිකාර ලබාගැනීමට ඇති අයිතිය ශ්‍රී ලංකා රජය විසින් පිළිගෙන ඇත. දැනට ක්‍රියාත්මක ජාතික සෞඛ්‍ය ප්‍රතිපත්තිය අනුව HIV ආසාදිත පුද්ගලයන්ට ප්‍රතිවෛරස ඖෂධ ලබාදීම සහ ඔවුන්ට වැළඳෙන අනෙකුත් ආසාදන සඳහා ප්‍රතිකාර ලබා දීම ලංකා රජය විසින් සිදු කරයි." (3.8 පිටුව 22)

06. තවද, 14.03.2016 දින SC.FR.No.77/2016 අංකය යටතේ දෙන ලද උසාවි නියෝගයට අනුව "රජය HIV ආසාදිත පුද්ගලයන්ගේ මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට, ප්‍රවර්ධනය කිරීමට සහ එයට ගරු කිරීමටත් ඔවුන්ට පවතින කොන්කිරීම ලංකාවෙන් තුරන් කිරීමටත් ක්‍රියා කල යුතුය." (පිටුව 4 )

07. යහපත් දරු උපතකට ගර්භනී මව්වරුනට පූරව ප්‍රසව අවධිය තුල ගුණාත්මක සේවාවක් සැපයීම රජයේ ප්‍රතිපත්තිය බව නැවතත් ප්‍රකාශ කර සිටින අතර උපදංශය සහ HIV සඳහා පරීක්ෂා කිරීම සහ ප්‍රතිකාර කිරීමද එයට ඇතුලත්ය. මෙම කාර්යය සාර්ථක කර ගැනීමට මම ඔබගේ අවංක සහයෝගය බලාපොරොත්තු වෙමි.

වෛද්‍ය පී. ජී. මහීපාල
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය,
"සුවසිරිපාය",
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

වෛද්‍ය පී.ජී. මහීපාල
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්:-

1. අධ්‍යක්ෂ, පුද්ගලික සෞඛ්‍ය අංශය, සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය.
2. සභාපති, විශේෂඥ ප්‍රසව වෛද්‍ය විද්‍යාර්ථයින්ගේ සංගමය.
3. සභාපති, නිදහස් වෛද්‍යවරුන්ගේ සංගමය.
4. සභාපති, ලංකා පවුල් වෛද්‍ය විද්‍යාර්ථයින්ගේ සංගමය.
5. සභාපති, ශ්‍රී ලංකා වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය.